-----------------------------------------------------------------------------------------------------------------------------------------

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව - 2012**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ට පටහැනිව සේවක ණය සම්බන්ධයෙන් වන ණය හානිකරණ වාසිය ලෙස වෙනත් මෙහෙයුම් ආදායම් තුළ රු. 648,000 ක් හා පෙර වර්ෂයට අදාලවූ රු. 757,000 ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය තුළද ඇතුලත් කර තිබුණි.

**1.2.2 ගණම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද බදු රු. 21,520,839 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි රු.40,751,000 ක ලෙස තිබීමේ ප්‍රතිඵලයක් ලෙස බදු ගෙවීම් රු. 19,230,161 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පසුගිය වර්ෂවල ප්‍රතිවෙළද ගිවිසුම් මගින් ජනිත වූ ණයහිමි ශේෂ වටිනාකම සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිවෙළද ගිවිසුම් විකුණුම් ලෙස ගිණුම්වල ගැලපීම මගින් සමාලෝචිත වර්ෂයේ ප්‍රතිවෙළද ගිවිසුම් ආදායම රු.19,632,842 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සේවාදායක ණයගැතියෝ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

---

(i) රු. 653,646,346 ක්වූ සේවාදායක ණයගැතියන් අතුරින් 2012 දෙසැම්බර් 31 දිනට අඩමාණ ණය වෙන්කිරීම රු. 126,345,830 ක් හෙවත් සියයට 19 ක් වී තිබුණි.

(ii) සංසථාව විසින් ණය පදනම මත ගුවන් කාලය සපයන අවස්ථාවේදී සේවාදායක ණයගැතියන් ඇති වන අතර ණය දීමේ ප්‍රතිපත්තිය අනුව ණය කාල සීමාව එක් මාසයකට සීමා වුවත් ණයගැතියන්ගෙන් මාසයකට වැඩි ණයගැති ප්‍රමාණය සියයට 76 ක් හෙවත් රු. 494,197,047 ක් ද මාස තුනකට වැඩි ණයගැති ප්‍රමාණය සියයට 34 ක් හෙවත් රු. 224,558,218 ක් විය. වසර තුනට වැඩි සේවාදායක ණයගැති ශේෂය රු.130,092,778 ක හෙවත් සියයට 20 ක් විය.

(iii) එසේම සේවාදායක ණයගැති ශේෂයෙන් සියයට 22 ක් හෙවත් රු. 146,549,495 ක් වු ණය රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු ඒවා විය. මෙම ණයගැතියන්ගෙන් රු. 9,229,054 ක් අයකරගත නොහැකි හා කාලාවරෝදයට අයත් ණය ශේෂ විය.

(iv) සේවාදායක ණයගැති ශේෂයෙන් සියයට 6 ක් හෙවත් රු. 42,147,586 ක් දේශපාලන පක්ෂයන්ගෙන් අයවිය යුතු වටිනාකම් වු අතර සම්පූර්ණ ශේෂයම අයකරගත නොහැකි ණය ශේෂ ලෙස හදුනා ගෙන තිබුණි.

(v) සේවාදායකයකුගේ නමක් සදහන් නොවන ගිවිසුම් 2 කට අදාල වර්ෂ 15 සිට වර්ෂ 17 දක්වා කාල පරාසයක සිට පැවත එන ණයගැති ශේෂ වටිනාකම රු. 320,600 ක් විය.

(vi) සාමාන්‍ය වෙළද ගිවිසුම් සදහා මුදල් අයකර ගැනීමේ සංස්ථා ප්‍රතිපත්තිය වන්නේ ගිවිසුමට අදාල සම්පූර්ණ ගුවන් කාලය සැපයීමෙන් පසුව ඉන්වොයිස්පත් නිකුත් කර මුදල් ලබාගැනීමයි. මෙම ප්‍රතිපත්තිය සංස්ථාවට අයවිය යුතු ණය මුදල් අයකර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

**(ආ) විවිධ ණයගැතියෝ**

සමාලෝචිත වර්ෂයේ අවසානයට සංස්ථාවේ රු. 52,440,000 ක් වු විවිධ ණයගැතියන්ගෙන් අඩමාණ ණය සදහා වෙන්කිරීම රු. 18,578,707 ක් හෙවත් සියයට 35 ක් වී තිබුණි. එම ශේෂය තුළ වර්ෂ 2 ක් හා ඊට වැඩි කාලයක සිට පැවත එන පුද්ගලයන්ගෙන් අයවිය යුතු රු. 248,545 ක් ද, විදේශීය රූපවාහිනී ආයතනයන්ගෙන් අයවිය යුතු රු.542,554 ක්ද, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු. 17,858,971 ක් සහ ප්‍රතිපූර්ණය කර ගත යුතු විදුලි ගාස්තු රු. 609,497 ක්ද වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේදී රක්ෂණ සමාගම් වෙතින් අයවිය යුතු රු. 621,033 ක ශේෂයක්ද ඇතුළත්වී තිබුණි. රු.52,440,000 ක් වු විවිධ ණයගැතියන් අතුරින් සියයට 35 ක් අඩමාණ ණය ලෙස වෙන්කිරීම හේතු කොට ගෙන සංසථාවේ ණය අයවීම පිළිබඳ පාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

**(ඇ) අත්තිකාරම් දීම හා පියවීම**

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 වර්ෂයේදී බාහිර පුද්ගලයකුට වැඩසටහන් නිෂ්පාදනය සඳහා අත්තිකාරම් ලෙස ලබා දී තිබුණු රු. 250,000 ක් 2012 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.

(ii) 2008 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවකුට රු. 450,000 ක් පරිගණක වැඩසටහන් හා අදාල කාර්යයක් සඳහා ලබා දී තිබු නමුත් එකී කාර්යය ප්‍රවර්තන වර්ෂය අවසාන වන විටත් සම්පූර්ණ කරගෙන නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ) මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විෂය | වටිනාකම | නොසැපයූ ලිඛිත සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | ණයගැතියෝ | 653,646,346 | නව ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව වර්ගීකරණ උප ලේඛන |
| (ii) | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වු මුදල් ප්‍රවාහය | 23,798,000 | ගණනය කිරීම්වලට අදාල තොරතුරු |
| (iii) | හානිකරණ ලාභය (Impairment Gain) | 648,000 | උප ලේඛන/ ගණනය කිරීම් වලට අදාල තොරතුරු |
| (iv) | වැඩසටහන් හා ප්‍රචාරය කිරීමේ හා මිලදී ගැනීමේ වියදම් | 162,733,993 | උප ලේඛන/ ගණනය කිරීම් වලට අදාල තොරතුරු |
| (v) | ආයෝජන - ලංකා පුවත් | 1,104,000 | හිමිකම් සහතික |
| (vi) | කෙරීගෙන යන වැඩ | 132,125 | උප ලේඛන |
| (vii) | වංචා පිළිබඳ තොරතුරු | ගණනය කළ නොහැක | විගණනයට ඉල්ලා සිටින ලද තොරතුරු |
| (viii) | සංස්ථාවේ ඉඩම හා සම්ප්‍රේෂණාගාර පිහිටි ඉඩම් (වර්පනම් වටිනාකම) | 46,018,720 | නෛතික සාක්ෂි ( හිමිකම් ඔප්පු , පැවරුම් පත්‍ර , ගැසට් නිවේදන ) |
| | එකතුව | 888,081,184 | |

(ආ) ප්‍රති වෙළඳ ගිවිසුම් යටතේ සංස්ථාවට ලබා ගන්නා ලද චිත්‍රපටවල වටිනාකම නිර්ණය කිරීම සඳහා වැඩසටහන් මිලදී ගැනීමේදී චිත්‍රපටයක මිල තීරණය කිරීම සඳහා යොදා ගන්නා මිණුම් දඬු මොනවාද යන තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුයෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

## 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය- 8.3.5 ජේදය | අරමුදලේ ප්‍රභවය කුමක් වුවත් නව දීමනා ඇති කිරීමේදී හා ප්‍රතිශෝධනය කිරීමේදී භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ පූර්ව අධිකාර් බලය ලබාගත යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු නොකර 2012 වර්ෂයේදී ඉන්ධන හා ප්‍රවාහන දීමනා වශයෙන් රු. 19,546,793 ක් ගෙවා තිබුණි. |
| (ආ) | 2003 මාර්තු 28 දිනැති මුදල් අමාත්‍යංශ ලේකම්ගේ එම්/ටීආර්/1/2005 ලිපිය | අවම මාසික කුලිය ඉක්මවා කුලී වාහන හා ඉන්ධන වෙනුවෙන් රු.4,020,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ජේදය | 2012 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 2008 ජුලි 28 දිනැති අංක පීඊඩී/ 50 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නියමයන්ට පටහැනිව ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හිමිකම ලෙස දක්වමින් MM වැටුප් කාණ්ඩයේ නිලධාරීන් 77 ක් හා JM හා MA වැටුප් කාණ්ඩයේ නිලධාරීන් 96 කට ප්‍රවාහන දීමනා රු.17,733,961 ක් ගෙවා තිබුණි. |
| (ඉ) | 2009 මාර්තු 24 දිනැති අංක 13/2008 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මාසිකව හිමි ඉන්ධන ලීටර ප්‍රමාණය ඉක්මවා නිලධාරීන් දෙදෙනෙකුට වැඩිපුර සපයා ඇති ඉන්ධන වල වටිනාකම රු.747,600 ක් විය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ බදු පෙර ලාභය රු. 47,478,000 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය රු.172,079,000 ක් වීමෙන් වර්ෂයේ බදු පෙර ලාභය රු. 124,601,000 ක අඩුවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළදී "චැනල් අයි " නාලිකාවේ ආදායම ඉකුත් වර්ෂයට වඩා සියයට 75 කින් හෙවත් රු.637,390,000 ක් අඩුවීම මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සංස්ථාවේ බදු පෙර ලාභය වශයෙන් රු. 47,478,000 ක් ගිණුම්වල නිරූපනය වුවද විදේශීය හා දේශීය ප්‍රදාන වෙනුවෙන් ලාභයට එකතකල රු.13,596,000 ක ක්‍රමක්ෂය, ණය හානිකරන වාසිය රු. 648,000 ක්,ණයගැති ගිණුම්වල තිබූ බැර ශේෂ රු. 21,911,053 ක් සහ බාහිර පාර්ශවයන් භාවිතා නොකරන ලද පසුගිය වර්ෂවලට අදාල ප්‍රතිවෙළඳ ගිවිසුම්වල වටිනාකම රු. 19,632,842 ක් ගැලපීමෙන් එකී ලාභය රු. 8,309,895ක අලාභයක බවට පරිවර්තනය වන බව නිරීක්ෂණය විය.

### 2.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

2012 දෙසැම්බර් 31 දිනට සංස්ථාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් නඩු 11 ක් පවරා තිබූ අතර සංස්ථා කාර්ය මණ්ඩලය විසින් නඩු 05 ක් පවරා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී නඩු 02 ක් අවසන් වී තිබුණි. මෙම නඩු සඳහා නිතීඥ ගාස්තු වශයෙන් බාහිර නීතීඥයින්ට රු. 6,913,073 ක ගෙවා තිබුණි. බාහිර පාර්ශවයන් විසින් පවරන ලද නඩු 07 කට අදාලව පැමිණිලි පාර්ශ්වය විසින් ඉල්ලා ඇති වන්දි මුදල රු. 1,012,400,000 ක් හා එක්සත් ජනපද ඩොලර් 250,000 ක් විය. එසේම රූපවාහිනී සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 25 ක් පවරා තිබූ අතර එම නඩු වලින් සංස්ථාව අයකර ගැනීමට බලාපොරොත්තු වන මුදල රු. 116,961,735 ක් විය. එයින් නඩු 03 ක සමාලෝචිත වර්ෂය තුළදී අවසන් වී තිබුණු අතර අයකර ගත් මුදල රු.375,000 ක් විය. මෙම නඩු සඳහා නිතීඥ ගාස්තු වශයෙන් බාහිර නීතීඥයන්ට රු.1,449,340 ක් ගෙවා තිබුණි. මල්‍ය ප්‍රකාශයන්හි ගිණුම් සටහන්හි දක්වා ඇති නඩු සම්බන්ධ අසම්භාව්‍ය වගකීම්වල වටිනාකම රු. 2,052,000,000 ක් විය.

### 2.4 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පහත සඳහන් වියදම් විෂයයන ඉකුත් වර්ෂයයේ වියදම සමග සැසඳීමේදී අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණි.

| වියදම් විෂයය | වියදම 2012 | 2011 | ඉකුත් වර්ෂයට වඩා වැඩිවීම | ඉකුත් වර්ෂයට වඩා වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| සංවත්සර සැමරුම් වියදම | 9,898,686 | 665,000 | 9,233,686 | 1388 |
| දැයට කිරුළ - | | | | |
| ශිල්පීන් වියදම | 579,600 | 213,000 | 366,600 | 172 |
| පැටවීමේ ගාස්තු | 1,050,912 | 305,000 | 745,912 | 245 |
| විවිධ වියදම් | 76,393 | 23,000 | 53,393 | 232 |

(ආ) 2011 වර්ෂය හා සසඳන විට 2012 වර්ෂයේ "රණවිරු රියල් ස්ටාර්"වැඩසටහන වෙනුවෙන් වූ විවිධ වර්ගයේ වියදම්වල වැඩිවීම සියයට 58 සිට සියයට 183 ක පරාසයක පැවතුණි. රණවිරු රියල් ස්ටාර් II වැඩසටහනෙන් සංස්ථාව ලැබූ පාඩුව රු.34,612,395 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රචාරණ දැන්වීම් ලබාගැනීම සඳහා සංස්ථාව පුවතපත් ආයතන සමග ප්‍රතිවෙළඳ ගිවිසුම්වලට එළඹ තිබූ නමුත් එම පහසුකම් භාවිතා නොකර සංවත්සර ප්‍රචාරක දැන්වීම් වෙනුවෙන් පුවත්පත් ආයතන වෙත රු.1,565,000 ක් වැයකර තිබුණි. නමුත් සංස්ථාව පුවත්පත් ආයතන සමග ප්‍රතිවෙළඳ ගිවිසුම්වලට එළඹ 2012 දෙසැම්බර් 31 දිනට රු. 27, 373,291 ක් පහසුකම් භාවිතා කර නොතිබුණි.

(ආ) **ප්‍රතිවෙළඳ ගිවිසුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 වර්ෂයේදී ප්‍රතිවෙළඳ ගිවිසුම් සඳහා ලබාදුන් ගුවන් කාලයේ වටිනාකම රු.66,958,158 ක් වූ අතර ඒ වෙනුවෙන් සංස්ථාව ලබාගත් සේවාවන්ගේ වටිනාකම රු. 36,223,000 ක් වූයෙන් සංස්ථාව රු.30,735,158 ක අලාභයක් ලබා තිබුණි.

(ii) සංස්ථාවේ ගුවන් කාලය සපයා තිබූ නමුත් නැවත සංස්ථාවට සේවාවක් ලබාගෙන නොමැති වසර 07 සිට 12 දක්වා කාලය අතර පවතින ප්‍රතිවෙළඳ ගිවිසුම් ශේෂවල

වටිනාකම රු.6,403,762 ක් වූ අතර 2003,2004 සහ 2005 වර්ෂවලට අදාලව ගිවිසුම අත්සන් කිරීමකින් තොරව සංස්ථාවේ ගුවන් කාලය සපයා ඇති වටිනාකම රු. 6,680,112 ක් විය. මෙම වටිනාකම මුදලින් අයකර ගැනීමට හෝ ඒ වෙනුවෙන් සේවාව ලබා ගැනීමට 2013 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) 2012 වර්ෂයේදී සංස්ථාව චිත්‍රපටයක් සඳහා ප්‍රතිවෙළඳ ගිවිසුමකට එළඹී අතර ගිවිසුමට එළඹෙන දිනම අදාල චිත්‍රපටය සංස්ථාවට ලබා දිය යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබූ අතර 2013 ජනි 30 දිනට පමා කාලය මාස 17 ක් විය. මෙම චිත්‍රපටය වෙනුවෙන් සංස්ථාව විසින් සපයා තිබූ ගුවන් කාලයේ වටිනාකම රු. 13,144,000 ක් විය.

(iv) 2012 වර්ෂයේදී ප්‍රතිවෙළඳ ගිවිසුම්වලට අදාලව සංස්ථාව විසින් ලබාගත හැකිව තිබූ එහෙත් ලබා නොගත් සේවාවන්ගේ වටිනාකම රු. 27, 373,291 ක් විය.

(v) ප්‍රතිවෙළඳ ගිවිසුමකට අදාලව ලබාගත යුතුව තිබූ රු. 4,600,000 ක් වටිනා ගුවන් ටිකට්පත් 125 ක් ලබාගැනීමට සංස්ථාව කටයුතු කර නොතබුණි.

(ඇ) **ටෙලිනාට්‍ය මිලදී ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ටෙලිනාට්‍ය මිලදී ගැනීමේදී සංස්ථාව හඳුන්වා දී තිබුණු අභ්‍යන්තර පාලන ක්‍රමවේද කිසිවක් අනුගමනය නොකර රු. 4,375,000 ක් වැය කර මිලදීගත් ටෙලිනාට්‍යයක් විකාශය කිරීමෙන් සංස්ථාවට රු. 1,569,545 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ii) ටෙලිනාට්‍යයක් විකාශනය සඳහා සුදුසුකම් ලැබීමට ටෙලිනාට්‍ය සමීක්ෂණ මණ්ඩල ඇගයීම් ලකුණු මට්ටම 50 ක් හෝ ඉන් ඉහළ අගයක් ගතයුතු වුවද, එයට පටහැනිව වටිනාකම රු.27,775,000 ක් වූ ටෙලිනාට්‍ය 2 ක් මිලදී ගෙන තිබුණි.

(iii) ටෙලිනාට්‍ය සඳහා ගෙවන මුදල තීරණය කිරීමේදී සමීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් ලකුණු සැලකිල්ලට ගනු ලබන මූලිකම කරුණක් වුවද, නියැදි පරීක්ෂණයට භාජනය වූ ටෙලි නාට්‍යය 10 කින් වටිනාකම රු. 54,290,000 ක්වූ ටෙලිනාට්‍යය 04 ක් මිලදී ගැනීමේදී ඇගයීම් ලකුණු සැලකිල්ලට ගෙන නොතිබුණි.

(iv) නොමිලේ ලබාදුන් ගුවන් කාල වටිනාකම රු. 10,000,000 ක් හා රු. 22,518,080 ක් වැයකර මිලදී ගත් වැඩසටහනක් ප්‍රචාරය කිරීමෙන් නියෝජිත කොමිස් ගාස්තු අඩුකිරීමට පෙර සංස්ථාව ඉපයූ ආදායම රු. 24,093,647 ක් වුයෙන් එම වැඩසටහන විකාශය කිරීමෙන් සංස්ථාවට රු.8,424,433 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඈ) **ආයෝජන**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1985 හා 1992 වර්ෂවලදී ලංකා පුවත් ආයතනයේ රු. 1,104,000 ක් ආයෝජනය කර තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණු අතර එම ආයෝජන තවදුරටත් එසෙම පවත්වා ගෙන ගොස් තිබුණි .

(ii) බැංකු අයිරා ලබාගැනීම සඳහා ලංකා බැංකුවේ පවතින රු. 22,000,000 ක් වූ ස්ථාවර තැන්පත් ඇපයට තබා තිබුණු අතර ඒ බව ගිණුම් සටහන්හි හෙළිදරව් කර නොතිබුණි. 2012 වර්ෂයේ දැරූ බැංකු අයිරා පොලිය රු. 1,260,957 ක් විය.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2009 වර්ෂයේ විකාශනය ආරම්භ කරන ලද NTV නාලිකාව වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා දරන ලද වියදම රු.18,186,000 ක් වූ අතර ආදායම් ඉපයීමක් සිදුකර නොතිබුණි.එසේම විකාශය පුළුල් කිරීම සඳහා පෞද්ගලික සමාගමක සම්ප්‍රේෂණ කුළුණක් භාවිතා කර ගෙවීම් කරන නමුත් එකී කුළුණ මගින් සිදුකරනු ලබන විකාශනවල ගුණත්වය, හා ආවරණ ප්‍රදේශවල ප්‍රගතියක් සිදුවී තිබේද යන්න පරීක්ෂා කිරීමට අවශ්‍ය සම්පෙෂණ තොරතුරු එක් රැස් කරගැනීමට හා පසුවිපරම් කටයුතු සඳහා සංස්ථාවේ අවධානය යොමු කර නොතිබුණි.

3.3 **මතභේදයට තුඩු දෙන ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන සංස්ථා සේවයෙන් මුදාහැර තිබුණු නිලධාරීන් 05 ක් වෙනුවෙන් 2012 වර්ෂය සඳහා රු. 3,743,720 ක් වැටුප්, අතිකාල හා ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.එම වටිනාකම තුළ මෙම නිලධාරීන් 05 දෙනා වෙනුවෙන් ගෙවා තිබූ අතිකාල දීමනාව රු.1,458,892 ක් වී තිබුණි.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව හා රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් පියවරයන් අනුගමනය කිරීමකින් තොරව සංයුක්ත සැලැස්ම සකස් කිරීම සඳහා උපදේශකවරයකු තෝරාගෙන තිබූ අතර ඒ සඳහා රු. 600,000 ක් වැය කර තිබුණි. තවද මේ සම්බන්ධව අවසන් සැසියක් පවත්වා තිබූ අතර ඒ වෙනුවෙන් රු. 129,811 ක් වැය කර තිබුණු අතර එය උපදේශක ගාස්තුවෙන් සියයට 22 ක් වී තිබුණි.

(ඇ) නිසි අධිකාර බලයකින් තොරව නියමිත ගුවන් කාල වටිනාකමින් සියයට 50 කට ආසන්න වෙළඳ වට්ටමක් හා මසක ණය කාලයක් ලබාදුන් විත්‍රපටයකින් 2013 ජුනි 30 දනට සංස්ථාවට අයවිය යුතු මුදල රු. 743,633 ක් වූ අතර මුදල් ගෙවීමේ ප්‍රමාද කාලය මාස 14 ක් විය. එම

සේවාදායකයාටම අයත් ප්‍රචාරණ ආයතනයක් වෙත එම ගනුදෙනුව වෙනුවෙන් රු. 154,780 ක නියෝජිත කොමිස් ගෙවා තිබුණි.

(ඇ) චිත්‍රපටයක ප්‍රචාරක දැන්වීමක් සඳහා නියමිත ගුවන් කාල වටිනාකමින් සියයට 50 විශේෂ වට්ටමක් හා රු.6,982,000 ක් වටිනා ගුවන් කාලයක් නොමිලේ ලබාදී තිබූ අතර ගිවිසුමට පටහැනිව වැඩසටහන් 3ක් වැඩියෙන් ප්‍රචාරය කර තිබුණි. මෙම ප්‍රචාරක දැන්වීමට අදාලව සංස්ථාව රු.9,982,000 ක් වූ පාඩුවක් ලබා තිබූ අතර එම චිත්‍රපටයේ සම නිෂ්පාදකට අයත් නියෝජිත ආයතනයක් වෙත රු.792,900 ක්වූ නියෝජිත කොමිස් මුදලක්ද ගෙවා තිබුණි.

(ඉ) රාජකාරි ගමන් සඳහා වාහනයක් අනුයුක්ත කිරීමේ හිමිකම් සහිත නිළධාරීන් වෙනුවෙන් වාහන කුලියට ගැනීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99අනුව හිමිකම් ලබන කිලෝ මීටර ප්‍රමාණය ඇගයීමකින් තොරව කුලී පදනම මත ලබාගත් මෝටර් රථ දෙකක් වෙනුවෙන් රු. 900,000 ක අමතර පිරිවැයක් දරා තිබුණි.

(ඊ) ධාවනය සඳහා යොදා නොගත් වාහනය නිදහස් නොකර, සංස්ථා පරිශ්‍රයේ ගාල් කොට තබා ගැනීම නිසා මාසිකව ධාවනය කළ කිලෝ මීටර ප්‍රමාණය වෙනුවට මාසයේ නිශ්චිත කිලෝ මීටර ගණන සඳහා ගෙවීම් කිරීම නිසා රු. 33,700 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(උ) රූපවාහිනී අභ්‍යාස ආයතනයේ සභාපතිගේ රාජකාරි වෙනුවෙන් නිදහස් කර තිබුණු කුලී වාහනයක් වෙනුවෙන් දරන ලද රු.188,140 ක්වූ වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රූපවාහිනි ශ්‍රව්‍ය දෘශ්‍ය පුස්තකාලයේ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා එහි කටයුතු පරිගණක ගත කොට වැඩිදියුණු කිරීම අරමුණු කර රු. 1,734,000 ක් වැයකර 2005 වර්ෂයේ මිලදී ගෙන තිබුණු ස්වයංක්‍රිය බාර්කෝඩ් පද්ධතියෙහි ( Automated Barcode Solution ) කොටස් කීපයක් හා විද්‍යුත් කැසට් ආරක්ෂණ පද්ධතිය ( EAS System ) 2013 ජුනි මාසය අවසාන වන විටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණු අතර එම ඇන්ටෙනාහි පැවැත්ම පිළිබඳව වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉංජිනේරු අංශයෙහි රු.18,053,000 ක්වූ අමතර කොටස් චලනය නොවන තොග ලෙස පැවතුණි.

### 3.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී ලබා නොගත් සේවාවක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවකුට ගෙවන ලද රු. 187,500 ක් අදාල පුද්ගලයන්ගෙන් හෝ එම ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට ප්‍රමාණවත් පියවර නොගෙන කපාහැර තිබුණි.

(ආ) වැඩසටහන් නිෂ්පාදනය කිරීම සඳහා 2006 හා 2007 වර්ෂයන්හිදී නිලධාරීන් ලබාගත් රු.78,050 ක් වූ අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කර නොතිබූ අතර වගකිවයුතු නිලධාරීන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී එම මුදල් පොත්වලින් කපාහැරීමට කටයුතු කර තිබුණි.

### 3.6 ප්‍රමාද වූ ව්‍යාපෘති

ප්‍රවෘත්ති අංශයේ ඉදිකිරීම් කටයුතු කිරීම සඳහා 2005 හා 2006 වර්ෂයන්හිදී උපදේශක ගාස්තු හා පස් සාම්පල් පරීක්ෂණ කටයුතු වෙනුවෙන් රු.183,051 ක් වැය කර තිබූ නමුත් අදාල ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද කෙරීගෙන යන වැඩ ගිණුමෙහි රු.132,125 ක් වූ හඳුනා නොගත් ශේෂයක් ඇතුළත්ව තිබුණි.

### 3.7 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 ජුනි 30 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 985 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 1007 ක් විය.අතිරික්ත කාර්ය මණ්ඩලය 22 ක් වී තිබුණි.

### 3.8 වාහන උපයෝජනය

සංස්ථාව සතු වාහන ඇණියෙහි වාහන ගණන 53 ක් වූ අතර එයින් වාහන 10 ක් කුළී පදනම මත ලබාගත් වාහන වන අතර වෙන්කළ වාහන සංඛ්‍යාව 06 ක් විය. 2012 වර්ෂය තුළදී සංස්ථා වාහනවලින් කි.මී.1,178,120 ක් හා කුළී පදනම මත ලබාගත් වාහනවලින් කි.මී. 401,856 ක් වශයෙන් ධාවනය කළ මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර 1,579,976 ක් වී තිබුණි. නඩත්තු වියදම රු. 8,531,196 ක් හා ඉන්ධන වියදම රු.15,805,019 ක් වැය කර තිබුණි. ඒ අනුව කිලෝ මීටරයකට දරන ලද නඩත්තුහා ඉන්ධන වියදම පිළිවෙලින් රු.7.24 ක් හා රු. 13.74 ක් විය.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ දින 76 ක ප්‍රමාදයකින් පසුව 2013මැයි 15 දිනදීය.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ලේඛනය තුළ අන්තර්ගත නොවූ රු. මිලියන 50 ක් වටිනා කාර්යයක් සඳහා 2012 වර්ෂය තුළදී ටෙන්ඩර් කැඳවා තිබුණි.

(ආ) 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගතවන සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදනය කරන ලද නමුත් ක්‍රියාත්මක නොකරන ලද ව්‍යාපෘති 05 ක මුළු වටිනාකම රු.මි.77.5 කි.

(ඇ) 2012 වර්ෂය තුළ අයවැය මගින් ප්‍රතිපාදනයන් සිදු නොකර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 06 ක වටිනාකම රු.මි. 150. 6 ක් විය.

### 4.3 අභ්‍යන්තර විගණනය

සංසථාවේ ස්ථිර අභ්‍යන්තර විගණකයකු සිටින අතර අභ්‍යන්තර විගණන ඒකකයේ සේවක සංඛ්‍යාව 06 ක් විය. පළමු අර්ධ වර්ෂය තුළ විගණන විමසුම් 22 ක්ද දෙවන අර්ධ වර්ෂය තුළ විගණන විමසුම් 24 ක්ද යවා තිබුණි.

### 4.4 උපක්‍රමික අලෙවි සැලැස්ම

සංස්ථාව සතුව පවතින ශක්තීන්,දුර්වලතා,අවස්ථා සහ තර්ජන හදුනාගැනීම තුළින් සංස්ථාවට ලාභදායීවන පරිදි විකුණුම් ප්‍රවර්ධනය සඳහා වූ උපක්‍රමික අලෙවි සැලැස්මක් 2012 වර්ෂය සඳහා සකස්කර නොතිබුණි.

## 4.5 විගණන කමිටු

2005 ජුලි 1 දිනැති අංක පිඊඩී/31 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව විගණන කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක්වත් රැස්විය යුතු වුවත්, 2012 වර්ෂය තුළ කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.

## 4.6 අයවැය ලේඛනමය පාලනය

ආදායම් නියමිත පරිදි ඇස්තමේන්තු නොකිරීම නිසා සමහර ආදායම් විෂයයන්ගේ අයවැයගත ඉලක්කයට වඩා සියයට 25 සිට සියයට 44 දක්වා පරාසයන්ගෙන් ආදායම වැඩි වී තිබුණු අතර සියයට 33 සිට සියයට 1062 දක්වා පරාසයන්ගෙන් ආදායම අඩුවීම්ද නිරීක්ෂණය විය. එසේම වියදමද නිසි ලෙස ඇස්තමේන්තු නොකිරීම නිසා සියයට 117 කින් වියදමෙහි වැඩිවීම් හා සියයට 14 සිට සියයට 65 දක්වා පරාසයන්ගෙන් වියදමෙහි අඩුවීම්ද නිරීක්ෂණය විය.මේ අනුව 2012 වර්ෂයේදී සංස්ථාව අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපති වෙත වරින්වර පෙන්වා දෙන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ණයගැති/ණයහිමිපාලනය
(ආ) අයවැය පාලනය
(ඇ) සේවක ණය පාලනය
(ඈ) අත්තිකාරම් පියවීම පාලනය
(ඉ) ප්‍රතිවෙළඳ ගිවිසුම්
(ඊ) ගුවන් කාල ආදායම් රැස්කිරීම
(උ) ගිණුම්කරණය